ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | අධිපති ලේකම් දෙපාර්තමේන්තුව |
| දිනය | 2015.12.09 |

**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා - 2006 සිට 2015**

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා විසින් අතිගරු ජනාධිපතිතුමා හට, තමන් වහාම ක්‍රියාත්මක වන පරිදි, අධිපති ධූරයෙන් ඉල්ලා අස්වීමට බලාපොරොත්තු වන බව දැනුම් දී තිබේ. මේ අනුව, අභිනවයෙන් පත් වූ අතිගරු ජනාධිපතිතුමා හට නව අධිපතිවරයෙකු පත් කිරීමට ඉඩ සැළසෙනු ඇත.

කබ්රාල් මහතා මහ බැංකුවේ අධිපතිධූරයට පළමුවරට පත් කරන ලද්දේ 2006 වසරේ ජූලි මස 1 වන දින සිට 2010 වසරේ ජූනි මස 30 වන දින දක්වා වූ ධූර කාලයක් සඳහාය. ඉන් අනතුරුව, 2010 වසරේ ජූලි මස 1 වන දින සිට 2016 වසරේ ජූනි මස 30 වන දින දක්වා ඉදිරියට වසර 6 ක ධූර කාලයක් සඳහා නැවතත් පත් කරන ලදී.